රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

**SLS 22643 – සිංහල පද්‍ය සාහිත්‍යය III**

**<u>පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.**

**කාලය : පැය 03**

---

1. පහත සඳහන් පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ)

නුවණැත්තවුන් පහකොට දුදනන් සෙවුන
නොමගත් සිත තුළෙහි ගුණ පොකුරඹ ලෙසින
මැදහත් නොව මසුරු ගුණයෙන් දවස’රින
රජුටත් එ රටටත් අතුරක් නැත වෙනින

පැමිණෙන ලොවට බුහු නා ගුණ යුතු නපුරු
මෙදියත නසිනු මිස යහපත නොවේ සරු
නොනැවත යුගත පත් වූ සඳෙහි සත් හිරු
විකසිත නොවී දා යෙයි සැම තැන තඹුරු

(30,31 පද්‍ය)

සුභාෂිතය (සංස්)සුචරිත ගම්ලත්

(ආ)

මවුපිය පරපුරෙ න
සක කිරි සෙ පිරිසිදුව න
තම කුලඹර දිලෙ න
සරා පුන් සඳ සිරින් හැම දි න

යුද කොට රටින් ර ට
නොයෙක විරිදුන් මුලුපු ට
එ තම කිතු මුතු ප ට
සරා ලූ අට දිගඹුවන් ක ට

(39,40 පද්‍ය)

කුස්තන්තිනූ හටන (සංස්:) රෝහිනි පරණවිතාන



120

(ඇ)

මොකැදුරුවන් අප මුනි දෙසූ දම ආල
කර අසමින් රකිනා විලසම සීල
දුසිරිතකම් දුරු කර සියලු ම ලීල
සත සතොසින් වැජඹෙති මෙහි හැම කාල

සරතැස වන් සතහට මෙහි හැම කාල
පිය සැනසුන් කරනට කළ කර ආල
පස පියුමෙන් ගැවසී සිටි වන ලීල
නුඹ ගඟමෙන් සිරිසිලි විල නව යාල

(09.10 පද්‍ය)

නීලකොබෝ සංදේශය, (සංස්:) පී.ඩී.ඇස්.වීරසූරිය

(ඇ)

ඒ ගංතෙරේ දිලි පහන්සිළු වන් ගඟෙ සේ
ආ නාපුරෙන් පුදමුරන් දදකැන් බබලා
ගන්නා සුපුන් ගුරුළුයය් සිතමින් බියෙන් උන්
ලා දිව් සිරින් කට මැණික් පළ වී එතැන්හී

යටග යටග සැදූ නන් දදන් කැන්
කිකිණි රැවින් අමතා සුරන් අහස් ගොස්
තොපමතට වඩා සියක් ගුණෙන් යුත්
දහමම ගන්ට එව’යි කියන්නවුන් මෙන්

(71,72 පද්‍ය)

ගංගාරෝහණ වර්ණනාව (සංස්:) සිරිතිලක සිරි

(ලකුණු 20 යි)

2. අලගියවන්න මුකවෙටි කවියාගේ කවිත්වයේ විවිධත්වය පිළිබඳව ඇගයීමක් කරන්න.

3. “<u>කුස්තන්තීනු හටන</u> සිංහල සාහිත්‍යයේ අමුතු මගක් ගත් කාව්‍යයකි.” විමසන්න.

4. <u>සුභාෂිතය</u> උපදේශ කාව්‍යයක් වසයෙන් අගය කල හැක්කේ කවර සාධක මත දැයි නිදසුන් ඇසුරින් පහදන්න.

5. මාතර සාහිත්‍ය අවධියෙහි ලේඛකයන්ගේ කෘතිවල දක්නට ලැබෙන විශේෂතා කවරේ දැයි පැහැදිලි කරන්න.

6. පුදබිමේ ජනයා කළ කී දේ මැනවින් සිතුවම් කිරීමෙහි ලා ගංගා රෝහණ වර්ණනා කවියා සතු වූ කුසලතාව අදාළ වර්ණනාව ඇසුරින් ඇගයීමට ලක් කරන්න.

7. මාතර සාහිත්‍යය පෝෂණය කළ කිවිදියන්ගේ නිර්මාණ පිළිබඳ විවරණයක් සපයන්න.

(02-07 පිළිතුරු සඳහා ලකුණු 10 බැගින්)

@@@@@@@@@@@@@@@



121